# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2025/30 – 2017 ජුනි 29 වැනි බ්‍රහස්පතින්දා – 2017.06.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/T/2015/42.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. එම්. සෝමසිරි මයා ඇතුළු සේවකයින් 18 දෙනා, මහවැලි කඳවුර, අංක ඩී.12, පිඹුරත්තෑව, අරලගංවිල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා සහ සබරගමු සංවර්ධන අමාත්‍ය, වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

සීදූව, ලියනගෙමුල්ල, කොළඹ පාර, අංක 42ඩී, කේ. ඒ. ටී. ප්‍රනාන්දු මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු, වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2017 ජුනි මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/T/2015/42.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ආර්. එම්. සෝමසිරි මයා ඇතුළු සේවකයින් 18 දෙනා, මහවැලි කඳවුර, අංක ඩී.12, පිඹුරත්තෑව, අරලගංවිල.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ,

"ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය කළ ඇතැම් සේවකයන්ට වයස අවුරුදු 57 න් ඔබ්බට එනම් වයස අවුරුදු 60 දක්වා සේවා දිගු ලබා දී තිබුනද ආර්. එම්. සෝමසිරි මයා ඇතුළු පහත සඳහන් සේවකයින් 18 දෙනාට වයස අවුරුදු 57 න් පසු සේවා දිගු ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් දිය යුතු සහනය කුමක් ද යන්න පිළිබඳව වේ.

01. ආර්. එම්. සෝමසිරි
02. ඊ. එම්. පොඩිමැණිකා
03. එම්. ජී. සීලවතී
04. එච්. එම්. හේමචන්ද්‍ර
05. ඩබ්ලිව්. ඒ. චන්ද්‍රානි
06. ඩබ්ලිව්. ජී. ධර්මදාස
07. එච්. එම්. විජේරත්න
08. ඩී. එස්. විල්බට්
09. ආර්. එම්. අනුලාවතී
10. ඩී. ඒ. ජයසුන්දර
11. එන්. එස්. සී. මෙන්ඩිස්
12. පී. එම්. කේ. මුදලිගේ
13. ඩී. සිරිපාල
14. ජේ. පී. සේනානායක
15. ඩබ්ලිව්. එස්. සාගරිකා කුමාරි
16. එස්. ගුණදස
17. එස්. චන්ද්‍රසිරි විජේසිංහ
18. ඒ. පී. මහින්දපාල

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 මැයි මස 17 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

07 - 397

---

මගේ අංකය: IR/COM/05/2016/115.

## ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත

### 4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ.එම්.සී.එල්. ප්‍රනාන්දු මිය, අංක. 91/10, ශාන්ත පීටර් පාර, මොරටුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් (ශ්‍රී ලංකා), අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය, වේලාතන්ත්‍රිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්

මාතලේ, මේල්පිටිය, අංක. 75, එස්. කාරියවසම් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2017 ජුනි මස 22 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/05/2016/115.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ.එම්.සී.එල්. ප්‍රනාන්දු මිය, අංක. 91/10, ශාන්ත පීටර් පාර, මොරටුව.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් (ශ්‍රී ලංකා), අංක 24, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

හොංකොං ඇන්ඩ් ෂැන්හයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් (ශ්‍රී ලංකා) ආයතනයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරවරියක ලෙස සේවය කළ යූ.එම්.සී.එල්. ප්‍රනාන්දු නමැති සේවිකාවට ඇගේ සේවය අවසන් කිරීමේදී, අදාළ ආයතනයේ ක්‍රියාත්මක වන "Define Contribution Scheme" යටතේ විශ්‍රාමික දීමනාවක් ලබා නොදීම යුක්ති සහගතද? එසේ නැත්නම් එම සේවිකාවට හිමිවිය යුතු සහනයන් කවරේද ?

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2017 ජුනි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

07 - 398

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.